# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,877,8 — 1969 ඔක්තෝබර් 31 වැනි සිකුරාද — 1969.10.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### තේ ප්‍රචාරක ආඥාපනත

1969 යේ අංක 26 දරන තේ ප්‍රචාරක (සංශෝධන) පනතින් සංශෝධනය වූ ආකාරයෙන් ඇති, තේ ප්‍රචාරක ආඥාපනතේ (169 අධිකාරය) 8 වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 1969 ඔක්තෝබර් 21 වැනි දින පැවැත්වූ ප්‍රසිද්ධ සැසියේදී මහජන නියෝජිත මණ්ඩලය විසින් සම්මත කරන ලද බව මෙයින් දනුම් දෙමි.

හේමා ද සොයිසා,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1969 ඔක්තෝබර් 31 වැනි දින,
මුදල් අමාත්‍යාංශය, කොළඹ.

### යෝජනාව

" (169 වැනි අධිකාරය වන) තේ ප්‍රචාරක ආඥාපනතේ 8 වැනි වගන්තිය යටතේ 1967 පෙබරවාරි 14 වැනි දින අංක 14,735/5 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද යෝජනාව අනුව දනට පනවනු ලැබ, අයකරනු ලබන හා ගෙවනු ලබන අපනයන තීරු බද්ද වෙනුවට 1969 නොවැම්බර් මස 1 වෙනි දින සහ ඉන් පසුව දිවයිනෙන් අපනයනය කරනු ලබන රාත්තල් සියයකට රුපියල් පහක තීරු බද්දක් සහ ඉන් අඩු ඕනෑම බරකට එසේ ප්‍රමාණානුකූලව පනවනු ලැබ අය කළ යුතු යැයි සහ ගෙවිය යුතු යැයි එකී වගන්තිය යටතේ මෙම සභාව යෝජනා කරයි. "

10–1244


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.

19 A——ජේ 8162 –) 11,100 (69/10)